# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2473/28 - 2026 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2026.01.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**
**ගම්පහ ප්‍රාදේශීය සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ගම්පහ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ගම්පහ ප්‍රාදේශීය සභාවේ අංක 08 පහළ යාගොඩ කොට්ඨාසයට තේරී පත්වූ මුදුන්කොටුවගේ ජයසිරි ගුණවර්ධන අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ගම්පහ ප්‍රාදේශීය සභාවේ අංක 08 පහළ යාගොඩ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජයසූරිය ආරච්චිගේ ප්‍රභාෂ් රංග ජයසූරිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ගම්පහ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි විතාන අප්පුහාමිල්ලාගේ රවීන්ද්‍ර වික්‍රමසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ජයසූරිය ආරච්චිගේ ප්‍රභාෂ් රංග ජයසූරිය, ගම්පහ ප්‍රාදේශීය සභාවේ, අංක 08 පහළ යාගොඩ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ,**
තේරීම්භාර නිලධාරි,
ගම්පහ ප්‍රාදේශීය සභාව.

2026 ජනවාරි මස 30 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

EOG 01 - 0293